# ප්‍රවෘත්ති

## එළවළු වැවිලි සරුකරන ලාභ පෝර වර්ගයක්.

එළවළු වගාවල අස්වැන්න වැඩි කිරීම සඳහා පෝර වර්ගයක් සෑදීමට බලපිටියේ අභ්‍යාස විද්‍යාලයේ ගොවිකම් අංශයේ කථිකාචාර්ය මහතෙක් නවීන ක්‍රමයක් සොයා ගෙන ඇති බව දැනගන්නට ලැබී තිබේ. ඒ පොහොර වර්ගය සකස්කර ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මෙසේය.

| | | |
|---|---|---|
| අමුකොළ සහ දිරාපත් දේ සියයට | 84 | සි. |
| ගොම් සියයට | 10 | සි. |
| ගව මූත්‍ර මිශ්‍ර පස් සියයට | 5 | සි. |
| අළු සියයට | 1 | සි. |

පිළියෙළ කර ගන්නා අයුරු:- ඉහත දැක්වෙන ද්‍රව්‍ය වලක දමා දින 14 කට 16 කට හා 30 කට පසු කලවම් කර නොතෙමෙන ස්ථානයක මාසයක් හොඳ ගසා තබා ඉක්බිති පැලවලට දැමිය යුතුයැයි ඒ මහතා කියන්නේය.

* * *

## මිරිස් පැළ පන් ලක්ෂයක් වැවීමේ ව්‍යාපාරයක්.

ගොවිකම් හා ආහාර නිෂ්පාදන නිලධාරි මහතුන් විසින් කෝංගල සිංහල පාසැලේ හා නරවල්පිට දකුණේ පාසැලේ අරඹන ලද තරුණ ගොවි සමිතියක් ඉතා උද්‍යෝගයෙන් ආහාර-යත් ක්‍රියා කරගෙන යන බව අපට දැනගන්නට ලැබී තිබේ. එම සමිතිවල සංවිධානයෙන් රජයෙන් ලබා ගන්නා ලද මිරිස් ඇට තවාන් කොට මිරිස් පැල පන්ලක්ෂයක් ලබාගෙන කෘෂිකර්ම හා ආහාර නිෂ්පාදන නිලධාරි මහතුන්ගේ උපදේශ අනුව තම තමන්ගේ ගෙවතුවල වවා සිටුවා ගන්නා අතර අවට ගම්වැසියන්ට ද එයින් කොටසක් බෙදාහැරීමෙන් විශාල මිරිස් පැල ව්‍යාපාරයක් අරඹා තිබෙන බව දැනගන්නට ලැබීම අපගේ ඉමහත් ප්‍රීතියට කරුණකි. (1952 ජනවාරි)

* • •

## පුදුම කොහිල වර්ගයක්.

අම්බලන්ගොඩ ගොවි මහතෙකු විසින් බොහෝ ප්‍රයෝජන ලබාගත හැකි කොහිල වර්ගයක් වවාගෙන තිබේ. ඒ මහතා විසින් කරන ලද අත්හදා බැලීමක ප්‍රතිඵලයක් වශයෙන් ඉහතකී කොහිල ගසකින් දිනපතා ආහාරයට සෑහෙන කොළ ලබාගත හැකි බැව් කියනු ලැබේ. උසින් අඩි 9½ ක් පමණ වූ මේ කොහිල වර්ගය ගෙවත්තක හෝ ගෙමිදුලක පහසුවෙන්ම වවා ගත හැකිය. කොළයක දිග අඩි 5 ක් පමණ වන අතර පළල අඩි 8 ක් පමණ වේ. මේ කොහිල ගසකින් දිනපතා ආහාරයට සෑහෙන කොහිල දළු ප්‍රමාණයක් ලබා ගත හැකි බැව් දැනගන්නට ලැබී තිබේ.

* * •

## අපේ ආහාර වියදම.

1951 වර්ෂය තුලදී පමණක් ලංකාවට රුපියල් හැට දෙකෝටි පනස් ලක්ෂයක පමණ වටිනා ආහාර ද්‍රව්‍ය තොගයක් ගෙන්වා තිබේ. ලංකාණ්ඩුව මගින් ඒ වර්ෂය තුලදී රුපියල් විසි කෝටියක ආධාර මුදලක් ආහාර ද්‍රව්‍ය සඳහා වියදම් කොට තිබේ. ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් ලෝකයේ සෑම රටක්ම විශාල කරදරයක යෙදී සිටින මෙකල මෙරට ජීවන වියදම අඩුකිරීම සඳහා රුපියල් විසිකෝටියක ආධාර මුදලක් රජය මගින් දීමෙන්-ජීවන වියදම පහල දැමීම සඳහා රජය මගින් විශාල සටනක් කරගෙන යන බැව් ඔබට වැටහෙනවා ඇත.

* • *

## ඉඩම් බෙදා දීම.

ආහාර ප්‍රශ්නය විසඳීම සඳහා ආණ්ඩුව මගින්-අප රට ගැමියනට වැඩි වැඩියෙන්

ඉඩම් ලබාදීම කරගෙන යනු ලැබේ. 1951 යේ අවුරුද්ද තුළ මේ සඳහා පෞද්ගලික ඉඩම් අක්කර 5126 ක් මිලයට ගෙන තිබෙන බව කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ උසස් නිලධාරි මහතෙකු ප්‍රකාශ කරයි. මේ ඉඩම් සඳහා රජය මගින් රුපියල් විසිපන් ලක්ෂ පනස්හතරදහස් අටසිය අසූ හතරක් (රු. 25,54884/= ක මුදලක් වියදම් කර තිබේ.

* * *

## ලංකාවට අවශ්‍ය ආහාර ප්‍රමාණය

ලංකාවේ ජනගහනය සඳහා වර්ෂයකට හාල් ටොන් පනස්ලක්ෂයක් අවශ්‍යය. ඉන්දියාව වැනි රටවල කෝටි සංඛ්‍යාත ජනතාව සාගින්නේ පෙළෙමින් මිය යන අතර ලංකාවට එවැනි තත්ත්වයකට මුහුණ පාන්නට නොසිදුවීම සැබවින්ම වාසනාවකි.

* * *

## සමූපකාර මධ්‍ය වෙළඳ පොළ.

පසුගිය කාලයේදී රජය මගින් ආහාර නිෂ්පාදනය සඳහා ගොවීන්ට පෞද්ගලිකව නොයෙක් අයුරින් ආධාර දී තිබේ. ගොවීන් විසින් නිපදවන ලද ද්‍රව්‍ය නියම මිලකට විකිණීමට ස්ථානයක් නොතිබීමේ පාඩුව පිරිමසාලීම සඳහා 1952 යේ ජනවාරි 30 වැනිදා අතිගරු ඩී. ඇස්. සේනානායක අග්‍රාමාත්‍යතුමා විසින් කොළඹ පිටකොටුවේ පැක්වේරි වත්තෙහි සමූපකාර මධ්‍යම වෙළඳ පොළක් විවෘත කරන ලදී. මෙරට නිපදවනු ලබන එළවළු ආදී ආහාර ද්‍රව්‍ය සතුටුදායක අන්දමින් බෙදා හැරීම සඳහා මෙවැනි සමූපකාර මධ්‍යම වෙළඳ පොළ වලින් අති මහත් සේවයක් ඉටුවනු නොඅනුමානය. දිවයිනේ නොයෙක් පළාත්වල දැනටමත් ගොවි ද්‍රව්‍ය අලෙවි කරන සමූපකාර සමිති පිහිටුවා ඇත. ගොවි මහතුන් විසින් නිපදවනු ලබන නොයෙක් ආහාර ද්‍රව්‍ය එම සමිති මගින් මිලට ගෙන පිටකොටුවේ සමූපකාර මධ්‍යම වෙළඳ පොළට එවනු ලැබේ. මේ හේතුවෙන් ආහාර ද්‍රව්‍ය නිපදවන ගොවීන්ටත් ද්‍රව්‍ය මිලදී ගන්නා මහජනයාටත් එකින් එක්වරම ඉමහත් සේවයක් ඉටුවේයැයි සිතිය හැක. නුදුරු අනාගතයේ දීම මෙම සමූපකාර මධ්‍යම වෙළඳ පොළ අංග සම්පූර්ණ වෙළඳ ආයතනයක් වන බවට අපි අනාවැකියක් පළකරමු.

* * *

## වියළි කලාපයේ ඉඩම් සංවර්ධන ව්‍යාපාරය.

කුරන්දන්කුලම හා ර. ලා. ප. නා. මේ යෝජනා ක්‍රමයන් අනුව විශාල සංවර්ධන ව්‍යාපාරයක් ආණ්ඩුව මගින් පටන් ගෙන තිබේ. ලංකාවේ වැඩිගෙන යන ජනගහනයට ආහාර සැපයීමට නම් වී ගොවිතැන පමණක් නොව වියළි ගොවිතැන ද දියුණු කළ යුතුව තිබේ. 1947 සිට 1951 වනවිට මේ ව්‍යාපාරය යටතේ බෙදා දෙන ලද ඉඩම් අක්කර ප්‍රමාණයත් පවුල් සංඛ්‍යාවත් මෙහි පහත සඳහන් වේ.

| | පවුල් ගණන | බෙදා දුන් අක්කර ගණන |
|---|---|---|
| ගම් විශාල කිරීමේ ව්‍යාපාර | 78562 | 124, 499 |
| ගොවිජනපද ව්‍යාපාර | 5965 | 47720 |
| මිලදී ගන්නා ලද වතු | 4088 | 9489 |
| වියළි කලාපයේ ගොවිතැන් ව්‍යාපාර | 80 | 1120 |
| එකතුව | 88690 | 182828 |

1926 වනවිට වී ගොවිතැන සඳහා යොදා තිබුනු ඉඩම් අක්කර ගණන 834,000 කි. නමුත් දැනට එම ප්‍රමාණය අක්කර 96000 කින් වැඩිවී තිබේ. වෙනත් ක්‍රමයකට කියනොත් එය අක්කර 930,000 දක්වා වැඩිවී තිබේ.

* * *

## ගල්ඔය යෝජනා ක්‍රමය.

මෙය දිවයිනේ නැගෙනහිර පළාතේ අරඹා ඇති බහු සංවර්ධන යෝජනා ක්‍රමයකි. ගල්ඔය හරහා විශාල වේල්ලක් බැඳ අක්කර 770000 ක ජලාශයක් ඇතිකොට ඒ මගින් අළුතෙන් කුඹුරු අක්කර 87000 කටද දැනට අස්වද්දා ඇති කුඹුරු අක්කර 8000 කට ද ජලය සැපයීමට අදහස් කරනු

ලැබේ. තවද මේ යෝජනා ක්‍රමයෙන් ගොඩ ගොවිතැන ද දියුණු කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව ගොඩ ඉඩම් අක්කර 60000 කද ගොවිතැන් කිරීමට අවකාශ ලැබෙන බව ගණන් බලා තිබේ. මේ ව්‍යාපාරය සම්පූර්ණ ගොවි-ක්‍රියාවේ යෙදුනු කල එකී පවුල් 35000 ක් පමණ පදිංචි කර වනු ඇත. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන වේල්ල දැනටම බැඳ අවසාන වී තිබේ. 1953 අවුරුද්ද අවසාන වනවාත් සමගම අක්කර 21000 ක පමණ ප්‍රදේශයකට වාරිමාර්ග පහසුකම් සලසා දීමට පුළුවන්වනවා ඇත. ඊට පසුව වර්ෂයකට අක්කර 10000 කට බැගින් වාරිමාර්ග පහසුකම් සැලැස්වීමට බලාපොරොත්තු වේ. මෙබඳු ව්‍යාපාර ඇති කිරීමෙන් - පැරකුම් සමයෙහි-මෙන් - නුදුරෙහි දීම මේ කුඹා දිවයින කිරියෙන් පැණියෙන් ඉතිරී බැබලෙන බව විචාරකයෙකුට නිර්භීතවම ප්‍රකාශ කළ හැකි වනු නොඅනුමානය. මෙරට කිරියෙන් පැණියෙන් බැබළී ස්වයං ශෝභිතවන ඒ දිනය ඈත් නොවේවායි, ප්‍රාර්ථනා කරමු.

* ● *

## පෞද්ගලික ඉඩම් මිලට ගැනීම.

1940 දී ආණ්ඩුව විසින් පෞද්ගලික ඉඩම් මිලදී ගෙන ගම් විශාල කිරීමේ ව්‍යාපාරයක් පටන් ගැනුනි. මේ දක්වා ආණ්ඩුව මගින් මිලදී ගන්නා ලද පෞද්ගලික ඉඩම් ප්‍රමාණය අක්කර 22500 කට කිට්ටුය. 1947-1951 දක්වා ඇති අවුරුදු සතර තුළ මේ ඉඩම් වැඩි හරියක් මිලට ගන්නා ලදී.

* ● *

## මිරිස් වැවීමේ ව්‍යාපාරය.

1950 ගේ වර්ෂය තුලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මිරිස් ඇට රාත්තල් 11000 ක්ද මිරිස් පැල 47,500,000 ක්ද ගොවීන් අතර බෙදාහරින ලදී. මේ මිරිස් ඇට හා පැල වලින් අක්කර 20000 ක් පමණ වගාකරන්නට පුළුවන්කම තිබුනි. එහෙත් අවාසනාවකට මෙන් 1949-1950 මාස් කන්නයේ හා 1950 යල කන්නයේදී මෝසම් සුළං වලින් ලැබෙන වැස්ස ප්‍රමාදවී ලැබීම නිසා-බලාපොරොත්තුවූ තරම් ප්‍රමාණයක මිරිස් වගාව කළ නොහැකි විය. කෙසේ වුවද 1950 ගේ වර්ෂය තුලදී අක්කර 6000 ක පමණ භූමි ප්‍රමාණයක මිරිස් වගා කරන ලදී.

● * *

## ඩොනමෝර් ක්‍රමය අනුව ඉඩම් බෙදා දීම.

1935 දී ඩොනමෝර් ව්‍යවස්ථාව අනුව පනවන ලද ඉඩම් සංවර්ධන පනත අනුව ආණ්ඩුව සතු ඉඩම් වලින් අක්කර 130,000 වඩා වැඩි තරම්වූ ඉඩම් ප්‍රමාණයක් ගම් විශාල කිරීම සඳහා ගැමියන් අතර බෙදා දෙන ලදී.

* * *

## ට්‍රැක්ටර්-ගොවිතැන.

ට්‍රැක්ටර් යන්ත්‍ර වලින් කුඹුරු හෑමෙන් ගොවිතැන් කිරීම පිළිබඳ මහාජන ප්‍රසාදය වැඩිවූ නිසා 1950 ගේ වර්ෂය තුලදී එසේ ගොවිතැන් කිරීම පිණිස මධ්‍යස්ථාන හතරක් ඇති කරණ ලදී. පරන්තන් ප්‍රදේශය කල්මුනෙයි ප්‍රදේශය-රිදී බැඳි ඇල හා විරවිලා ප්‍රදේශයේත් ට්‍රැක්ටර් ගොවිතැන පටන් ගන්නා ලදී. මේ ක්‍රමයෙන් 1950 ගේ වර්ෂය තුලදී අක්කර 6000 පමණ වී ගොවිතැන කරන ලදී. අක්කරයක් හෑමට හා පෝරු ගෑමටත් රුපියල් විසි හතරක්ද, පෝරුගෑමට පමණක් අක්කරයකට රුපියල් පහළොවක් ද අය කරණ ලදී.

* * *

## ඉදල් ඉරිඟු ගොවිතැන.

වී මෙන්ම ඉදල් ඉරිඟු ද මනුෂ්‍ය ආහාරයට ඉතා සුදුසුය. සහල් වලින් පිළියෙල කළ හැකි හැම ආහාරයක්ම ඉදල් ඉරිඟු සහල් වලින් ද පිළියෙල කරගත හැක. ඒ නිසා ඉදල් ඉරිඟු ගොවිතැන දියුණු කිරීම පිණිස කෘෂිකර්ම ප්‍රචාරක අංශයෙන් විශාල ප්‍රචාරක ක්‍රියාකලාපයක් ඇති

කරගෙන යනු ලැබේ. පිටරටින් ගෙන්වන ලද දියුණු කරන ලද වර්ගවල ඉදූල් ඉරිඟු දූකට රජයේ ගොවිපලවල වගාකරනු ලැබේ. ජනපද ව්‍යාපාරිකයන්ට මෙන්ම ගැමියන්ට ද ඉදූල් ඉරිඟු වැවීමට ගොවිකම් ප්‍රචාරක අංශය මගින් නන් අයුරින් අනුබල දෙනු ලැබේ.

විශේෂයෙන්ම ඉදූල් ඉරිඟු වලින් නොයෙක් ආහාර වර්ග පිළියෙල කර ගන්නා අයුරු කෘෂිකම් ප්‍රචාරක අංශයෙන් නොයෙක් මධ්‍යස්ථානවල ප්‍රදර්ශනය කර පෙන්වනු ලැබේ. වයඹ පළාතේ ගොවියෝ ඉදූල් ඉරිඟු වැවීමට විශේෂ උනන්දුවක් දක්වති. දැනටමත් අක්කර 2100 ක පමණ ඉදූල් ඉරිඟු වගාකර තිබේ.

* * *

## එළවළු.

දියුණු කරණ ලද වර්ගවල එළවළු ඇට වගාකිරීම සඳහා එළවළු ගොවිතැන් කරන අයට කෘෂිකම් දෙපාර්තමේන්තුව මගින් දෙන ධෛර්‍ය සුලුපටු නොවේ. ග්‍රාම සංවර්ධන සමිති මගින් හා මහිලා සමිති මගින් ද එළවළු වැවීමට ධෛර්‍ය දෙනු ලැබේ. මේ සඳහා සුදුසු එළවළු ඇට වර්ග සැපයීමේ කාර්‍යය රජයේ ගොවිපලවල් මගින් කරනු ලැබේ. 1950 ගේ වර්ෂය තුලදී කටුගස්තොට පිහිටි උද්භිද විද්‍යාඥතුමාගේ බීජ ගබඩාවෙන් පමණක් එළවළු ඇට රාත්තල් 8070 ක් පමණ බෙදා හැර තිබේ.

* * *

## බඩ ඉරිඟු හා කුරක්කන්.

බඩ ඉරඟු හා කුරක්කන් වැනි ධාන්‍ය වර්ග වැවීම ගැන ද කෘෂිකම් දෙපාර්තමේන්තුව මහත් උනන්දුවක් දක්වයි. 1950 ගේ වර්ෂය තුල ඊට පලමු වර්ෂවලට වඩා කුරක්කන් හා බඩ ඉරිඟු වගාකර තිබේ. මේ වර්ෂය තුල E 43 වර්ගයට අයත් කුරක්කන් බුසල් 497 ක් හා බඩ ඉරිඟු බුසල් 1440 ක්ද රජයේ ගොවිපලවල් මගින් වගා කිරීම සඳහා බෙදා හරින ලදී.

### කෘෂිකම් ප්‍රචාරක අංශයේ

## ශාඛාවක් හා භාණ්ඩ ගබඩාවක්.

()

කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක අංශයේ ශාඛාවක් හා වෙළඳ ගබඩාවක් මහනුවර වෝඩ්වීදියේ "ලේක් බිල්ඩිං" නමැති (පරණ මිලර් සාප්පුව) ගොඩනැගිල්ලේ විවෘතකර තිබේ. දෙපාර්තමේන්තුවේ ගොවිපලවල නිපදවන, ධාන්‍ය, එළවලු, පලතුරු ආදී නොයෙකුත් ද්‍රව්‍යයන් කුණ්ඩසාලේ කාන්තා කෘෂිකම් විද්‍යාලයේ නිපදවන නානා වෙළඳ ද්‍රව්‍යයන්, දෙපාර්තමේන්තුව මගින් ප්‍රසිද්ධ කරන අගනා පොත්පත් ආදියත් මෙහිදී මිලදී ගන්නට පුලුවන.

සී. බී. පටවර
කෘෂිකම් ප්‍රචාරක නිලධාරිතුමා.